## Abstract No 89

# ථේරවාදය සහ මහායානය තුළ එන බෝධිසත්ත්ව සංකල්පය පිළිබඳ ව අධ්‍යයනයක්

**පූජ්‍ය. ඕපනායක සුසීම හිමි,**
(ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර - බෞද්ධ දර්ශනය, කැලණිය විශ්වවිද්‍යාලය
suseemathero90@gmail.com

"බොධියාසත්තො බොධිසත්තො" යනුවෙන් ථෙරවාදයෙහිත් "බොධෞ ඥානෙසාත්වාං අභිප්‍රායොස්තීනි බෝධිසත්ත්වඃ" යනුවෙන් මහායානයෙහිත් එන බෝධිසත්ත්ව සංකල්පය පිළිබඳ ව මුල් බුදුසමය තුළ විරල වශයෙන් සාකච්ඡා වුවත්, දෙවන ධර්ම සංගායනාවෙන් පසු ව විලෝමනය වූ බුද්ධශාසනය ප්‍රධාන වශයෙන් නිකායන් කිහිපයක් බවට පත්වීමත් සමඟ පශ්චාත්කාලීන ව ඇති වූ බෞද්ධසම්ප්‍රදායන්, එනම් ථේරවාද නොවූ බෞද්ධ ගුරුකුල මුල් බුදුසමයට අයත් ඉගැන්වීම් වෙනස් කොට ඒවාට නවමු අදහස් සපයමින්, සංස්කෘත මුඛ්‍යභාෂාව කොට ගනිමින් බෝධිසත්ත්ව සංකල්පය දාර්ශනික වශයෙන් වර්ධනය කරන ලදී. එහි ආරම්භය මහාසාංඝිකයන්ගෙන් සිදු වූ අතර එහි වර්ධනීය අවස්ථාව මහායාන බුදුදහම තුළින් සිදු විය. ථේරවාද සම්ප්‍රදායට අයත් බෝධිසත්වයෝ එක් අයෙකු වන අතර දීපංකර පාද මූලයේ සිට පාරමිතා ධර්ම සම්පූර්ණ කරමින් බුද්ධත්වයට පත් වේ. නමුදු මහායාන බුදුදහම තුළ උගන්වනු ලබන්නේ සියලු දෙනා ම බුදුවීමෙන් නිවන් දැකිය යුතු ය යන්නයි. එහි දී සියලු දෙනා ම බෝධිසත්ත්වවරු විය යුතු ය. ථේරවාදයේ මෙන් ම මහායාන දර්ශනය තුළ ද එන බෝධිසත්ත්වයන්ගේ මුඛ්‍ය අරමුණ වන්නේ බුදුවීම ය. එම ක්ෂේම භූමියට ගමන්කරන උභය පාර්ශවයේ බෝධිසත්ත්වවරුන්ගේ විවිධ වෙනස්කම් දක්නට ලැබේ. පාලි සාහිත්‍යයේ එන ථේරවාද බෝධිසත්ත්වයන් ගැන දක්වා ඇත්තේ කෙබඳු අයුරින් ද යන්නත්, මහායාන බුදුදහමේ එන බෝධිසත්ත්වවරුන් පිළිබඳ ව සංස්කෘත සාහිත්‍යය තුළ කෙබඳු අයුරින් දක්වා ඇත්තේ ද යන්නත් විමර්ශනය කිරීම මේ තුළින් අපේක්ෂා කෙරේ.

**ප්‍රමුඛපදඃ** ථේරවාදය, පාලි සාහිත්‍යය, මහායානය, බෝධිසත්ත්ව සංකල්පය, සංස්කෘත සාහිත්‍යය